# ප්‍රගති වාර්තාව

## முன்னேற்ற அறிக்கை

# Progress Report

# 2024

**කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**கமத்தொழில்,கால்நடை வளங்கள் ,காணிமற்றும்**

**நீர்ப்பாசனஅமைச்சு**

**Ministry of Agriculture, Livestock, Land and Irrigation**

## ඉඩම් අංශය

காணி பிரிவு

## Land Section

# ප්‍රගති වාර්තාව - 2024

## ඉඩම් අංශය

**කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

# පටුන



| | පිටු අංකය |
|---|---|
| 1. **කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** (ඉඩම් අංශය) | 1 - 3 |
| 1.1.ඉඩම් සංවර්ධන අංශය | 4-6 |
| 1.2.ඉඩම් අත්පත් අංශය | 6-7 |
| 1.3.ඉඩම් ප්‍රතිපත්ති අංශය | 8-9 |
| 1.4.ව්‍යාපෘති අංශය | 9-10 |
| 1.5.පාලන අංශය | 11-12 |
| 1.6.ගිණුම් අංශය | 12 |
| 1.7.ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය | 12-13 |
| 2. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 14 - 22 |
| 3. ඉඩම් මැනුම් සභාව | 23 - 25 |
| 4. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 26 - 28 |
| 5. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 29 - 32 |
| 6. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 33 - 35 |
| 7. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 36 - 38 |

# 01. ඉඩම් අංශය

## හැඳින්වීම

1927 වර්ෂයේ දී එවකට පැවති රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් ඉඩම් හා කෘෂිකර්ම විෂය සම්බන්ධව සිදු කළ කමිටුවේ නිර්දේශ මත, රජයේ ඉඩම් ප්‍රශස්ත අයුරින් කළමනාකරණය කිරීමේ අරමුණින් 1932 වසරේ දී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය ස්ථාපනය කර ඇත.

පසුව විවිධ අමාත්‍යාංශ ලෙස එය සංශෝධනය වී ඇති අතර, 2022 වර්ෂයේදී අංක 2289/43 හා 2022.07.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් එය සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය ලෙසද, මේ වන විට 2024/11/25 දිනැති අංක 2412/08 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් කෘෂිකර්ම , පශු සම්පත් , ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ලෙස ස්ථාපනය කර ඇත.

ඒ අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉඩම් අංශයේ අධීක්ෂණය හා මගපෙන්වීම මත එයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන මඟින් රජයේ ඉඩම් ප්‍රශස්ථ අයුරින් කළමනාකරණය කිරීමට අදාළ කාර්යයන් සිදු කරනු ලබයි. ඉඩම් අංශය යටතේ ඇති පැරණිතම දෙපාර්තමේන්තුව වන ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, 1800 වර්ෂයේ අගෝස්තු මස 02 දින පිහිටුවා ඇති අතර එමඟින් රජයේ ඉඩම් මැනුම්කරණය සහ පිඹුරුපත් සැකසීම මෙන්ම නිවැරදි දත්ත සැපයීමේ කාර්යය ද සිදුකරනු ලබයි.

1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනතින් ස්ථාපිත කර ඇති ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඉඩම් පරිපාලනයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කරන අතර එමඟින් දීමනාපත්‍ර, බලපත්‍ර සහ බදුකර ලබාදීම, ජංගම සේවා පැවැත්වීම යනාදී ඉඩමක හිමිකාරීත්වය තහවුරු කරන කාර්යයන් සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකාව තුළ පිහිටි ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු විධිමත් හා කාර්යක්ෂමව සිදුකිරීමේ අරමුණින් 1903 වර්ෂයේ දී ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව පිහිටුවා ඇති අතර එහි ප්‍රධාන කාර්යභාරය වනුයේ මහජනතාව උදෙසා නිරවුල් බිමක අයිතිය තහවුරු කිරීමයි. මෙම ආයතනය මඟින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුකූලව ඉඩම් සඳහා නිරවුල් හිමිකම තහවුරු කර විධිමත් හිමිකම් සහතිකයක් ලබා දීමේ "බිම් සවිය වැඩසටහන" ක්‍රියාවට නංවනු ලබයි.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව 1983 වර්ෂයේ දී ඉඩම් හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය වශයෙන් ආරම්භ කර, 2010 ජනවාරි මස සිට දෙපාර්තමේන්තුවක් ලෙස උසස් කර ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් ජාතික ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර ක්රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙමඟින් ඉඩම් සම්පතෙහි ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි තිරසාර ඉඩම් පරිහරණයට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් ස්ථාපිත කරනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ශ්‍රී ලංකාව තුළ පුද්ගලයෙකුට තබාගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම, සුරක්ෂිත කිරීම සහ එම ඉඩම් ඵලදායි අන්දමින් සංවර්ධන ක්‍රියාවලියට යොමු කිරීම සිදු කරනු ලබයි.

මෙයට අමතරව මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ දෙපාර්තමේන්තුවට ආවේණික කටයුතු සඳහා නිලධාරීන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ද 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන අනුව මිනින්දෝරු සේවාවේ වෘත්තීය ප්‍රමිතීන් ක්‍රමවත්ව පවත්වාගෙනයාමේ අරමුණින් ඉඩම් මැනුම් සභාව ද පිහිටුවා ඇත. 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත මඟින්, ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඇතිවන ගැටළු විසඳා ගැනීමේ අරමුණින් ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය ද පිහිටුවා ඇත.

රජයේ ඉඩම් කාර්යක්ෂමව හා ප්‍රශස්ථ අයුරින් කළමණාකරණය කිරීමේ කාර්යය, කෘෂිකර්ම , පශු සම්පත් , ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉඩම් අංශය යටතේ ඇති ඉඩම් සංවර්ධන, ඉඩම් අත්පත්, ඉඩම් ප්‍රතිපත්ති, සැලසුම් , ව්‍යාපෘති, පාලන, ගිණුම්, සහ අභ්‍යන්තර විගණන යන අංශ මඟින් ඉටුකරනු ලබයි.

## දැක්ම

“ තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රශස්තව උපයෝජිත භූමි සම්පතක් ”

## මෙහෙවර

“සැමට විධිමත් නිරවුල් හිමිකමක් හා ප්‍රශස්ත උපයෝජනයක් අත්කර දෙමින් සියලු පාර්ශවකරුවන් වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය මඟින් භූමි සම්පත කාර්යක්ෂමව කළමනාකරණයෙන් තිරසාර සංවර්ධනයට දායක වීම”.

## ඉඩම් අංශය යටතේ ඇති ආයතන

- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
- මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය
- ඉඩම් මැනුම් සභාව
- ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

## නීති සහ අණපනත්

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත - 1972 අංක 1
- ඉඩම් අත්කර ගැනීමේ පනත - 1950 අංක 9
- ඉඩම් සංවර්ධන ආඥා පනත - 1935 අංක 19
- ඉඩම් ආපසු පවරා ගැනීමේ ආඥා පනත - 1942 අංක 61
- රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත - 1979 අංක 43
- රජයේ ඉඩම් ආඥා පනත - 1947 අංක 8

- රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත - 1979 අංක 7
- මැනුම් පනත - 2002 අංක 17
- හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත - 1998 අංක 21
- ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත - 1931 අංක 20

## විෂය පථය

ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් හරහා ප්‍රශස්ත ඉඩම් කළමනාකරණයක් තුළින් සංවර්ධන කාර්යයන්, නේවාසික කටයුතු හා පොදු අවශ්‍යතා සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යටතේ ඉඩම් ලබාදීම හා අනාගත පරපුර සඳහා භූමියේ අයිතිය සුරක්ෂිත කිරීම.

## ඉඩම් අංශයේ කාර්යයන්

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ඉඩම් විෂයෙහි සහ අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- රජයේ ඉඩම් පරිපාලනය හා කළමනාකරණය.
- ඵලදායී ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය සඳහා නව නීති රාමුවක් සම්පාදනය කිරීම.
- ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- ජාතික ඉඩම් සභාවක් පිහිටුවීම.
- ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු.
- රටේ සංවර්ධනය සඳහා අවශ්‍යවන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම.
- සියලුම පළාත් පාලන ආයතන සහ ඉඩම් කළමනාකරණ ආයතන සම්බන්ධ කරමින් ඒකාබද්ධ ඉඩම් තොරතුරු යටිතල පහසුකම් (integrated land information infrastructure) ක්‍රියාත්මක කිරීම.
- රජයේ කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදා දීම.
- ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් ලබාදීම.
- රජයේ හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති ඉඩම් සම්බන්ධව දත්ත පද්ධතියක් සකස් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

## 1.1. ඉඩම් සංවර්ධන අංශය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කටයුතු අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය කිරීම ,අධීක්ෂණය, මඟපෙන්වීම සිදු කරනු ලබයි.

### 1.1.1. ඉඩම් සංවර්ධන අංශයේ අරමුණු සහ කාර්යභාරයන්

වගුව: 01.

| අරමුණු | කාර්යභාරයන් |
|---|---|
| ඉඩම්වල වටිනාකම සහ ඵලදායිතාවය ඉහළ නැංවීම. | රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික, කෘෂිකාර්මික සහ වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදුකර හා නේවාසික කටයුතු සඳහා දීමනාපත්‍ර ලබාදීම. |
| රජයේ ඉඩම් කළමනාකරණය කර රටේ සංවර්ධන අරමුණු සඳහා වෙන් කිරීම. | රජයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන,ත්‍රිවිධ හමුදාව හා වෙනත් රාජ්‍ය ආයතන වෙත ඉඩම් බැහැර කිරීම. |
| | නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි ආයතන සඳහා සංවර්ධන කටයුතු වලට රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍රයන් ලබාදීම. |
| ආගමික හා සංස්කෘතික සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම. | බෞද්ධ විහාරස්ථාන සඳහා සහ අනෙකුත් ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් බැහැර කිරීම. |
| ආපදාවන්ට ලක් වූ පුද්ගලයින්ට, පවතින භූමි සම්පතින් සහන සැලසීම. | සුනාමි සහ විවිධ ආපදාවන්ට ලක්වූ පුද්ගලයින්ට රජයේ ඉඩම්ආඥා පනත යටතේ දීමනාපත්‍රයන් ලබාදීම. |
| ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම. | • රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදුකර හා දීමනාපත්‍ර ලබාදීම.<br>• ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ව්‍යවස්ථාපිත බැදීම්, පවුල තුල පැවරීම්, බදු දීම් හා විකිණීමෙන් පවරාදීම සඳහා ඉඩම් ලබාදීම. |

### 1.1.2. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය

වගුව: 02.

| | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් යොමු කර ඇති දීර්ඝ කාලීන බදු ගොනු ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කිරීම | 3510 | 2042 | 58 |
| 2. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලද බදුකර ජනාධිපති ලේකම් වෙත යොමු කිරීම | 500 | 259 | 51 |
| 3. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලද දීමනාපත්‍ර (විශේෂ දීමනාපත්‍ර හා රණවිරු දීමනාපත්‍ර ද ඇතුලත්ව) ජනාධිපති ලේකම් වෙත යොමු කිරීම | 1020 | 510 | 50 |
| 4. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලද පූජාභූමි හා දීමනාපත්‍ර ජනාධිපති ලේකම් වෙත යොමු කිරීම | 50 | 23 | 46 |

| | | | | |
|---|---|---|---|---|
| 5. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලද සුනාමි දීමනාපත්‍ර නිර්දේශ ජනාධිපති ලේකම් වෙත යොමු කිරීම | 100 | 140 | 140 |
| 6. | ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලද සුනාමි දීමනාපත්‍ර ජනාධිපති ලේකම් වෙත යොමු කිරීම | 100 | 148 | 148 |
| 7. | රජයේ ආයතනවලට, පළාත් පාලන ආයතන හා ත්‍රිවිධ හමුදාව වෙත ඉඩම් පැවරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලද නිර්දේශ ජනාධිපති ලේකම් වෙත යොමු කිරීම | 450 | 105 | 23 |
| 8. | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙතින් යොමු කර ඇති නිරවුල් කිරීමේ ගොනු ගරුඅමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කිරීම | 8 | 1 | - |
| 9. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් යොමු කරන ලද ව්‍යවස්ථාපිත බැදීම්,පවුල තුල පැවරීම්, බදු දීම් හා විකිණීමෙන් පවරාදීම ගරුඅමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කිරීම | ඉල්ලීම් ලැබෙන පරිදි | 28 | - |
| 10. | රජයේ ඉඩම් ගැටළු ලිපිවලට කටයුතු කිරීම් | ඉල්ලීම් ලැබෙන පරිදි | 2071 | - |

## 1.1.3 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

- ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් යොමු කරන දීර්ඝ කාලීන බදු නිර්දේශ ගොනු ගරු ඇමතිතුමාගේ අනුමැතියට යොමු කිරීම.
- ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් යොමුකරන,
  - බදුකර
  - දීමනාපත්‍ර
  - පූජාභූමි දීමනාපත්‍ර / වෙනත් ආගමික සිද්ධස්ථාන ලියවිලි
  - සුනාමි දීමනාපත්‍ර නිර්දේශ සහ
  - සුනාමි දීමනාපත්‍ර පරීක්ෂා කර අනුමැතිය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම
- රජයේ ආයතනවලට , (නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඇතුළුව), පළාත් පාලන ආයතන හා ත්‍රිවිධ හමුදාව වෙත ඉඩම් පැවරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු ඇමතිතුමාගේ නිර්දේශ සමඟ ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම.
- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් යොමු කරන නිරවුල් කිරීමේ ගොනු ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කිරීම.

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් යොමු කරන ලද ව්‍යවස්ථාපිත බැඳීම්, පවුල තුළ පැවරීම්, බදු දීම් හා විකිණීමෙන් පවරාදීම ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කිරීම.
- රජයේ ඉඩම් ගැටළු ලිපි වලට කටයුතු කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ ඉඩම්, පුද්ගලයින් හා ආයතන වෙත බැහැර කිරීමේ කටයුතු වඩාත් ඉක්මන් සහ සරල කිරීමේ අරමුණින් E-Slims ව්‍යාපෘතිය සමඟ සම්බන්ධව කටයුතු කිරීම.

## 1.2. ඉඩම් අත්පත් අංශය

රජයේ සංවර්ධන ක්‍රියාවලින් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය වන රජයේ ඉඩම් නොමැති අවස්ථාවලදී ඒ සඳහා පෞද්ගලික ඉඩම් අත්කර ගැනීමට 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත හා ඊට අදාළ සංශෝධිත විධිවිධානයන්ට අනුකූලව ඉඩම් අත්කර ගැනීමේ කාර්යභාරය ඉටු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි. තවද, සංවර්ධන ව්‍යාපෘතින් සඳහා කඩිනමින් පෞද්ගලික ඉඩම් රජයට අත්කර දීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමද රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අත්කරගනු ලබන ඉඩම් සඳහා වන්දි ගෙවීම හා අත්කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අත්කර ගැනීමේ නිලධාරින් නියාමනය කිරීම ද, මෙම අංශයේ කාර්යභාරය වේ.

### 1.2.1. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය.

**වගුව: 03.**

| වන්දි හා පොළී ගෙවීම් වලට අදාළව ප්‍රගතිය | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රගතිය | මිලියන 2,828.5 | |
| භෞතික ප්‍රගතිය | අයදුම්පත් 283 | |
| **අංශයේ ගොණු වලට අදාළ ප්‍රගතිය** | | |
| **ක්ෂේත්‍ර අනුව ඉඩම් අත්කර ගැනීම** | **අත්කර ගැනීම් ආරම්භ කරන ලද ඉඩම් ඒකක ප්‍රමාණය** | **අත්කර ගැනීම් ආරම්භ කරන ලද ඉඩම් ප්‍රමාණය (හෙක්.)** |
| මහාමාර්ග | 22 | 17.433 |
| වාරිමාර්ග | 3 | 0.8356 |
| පානීය ජලය | 6 | 0.4109 |
| නාගරික සංවර්ධන | 2 | 4.1039 |
| ආරක්ෂක කටයුතු | 17 | 17.269 |
| ගම් පුළුල් කිරීම | 5 | 12.007 |
| ස්වදේශ කටයුතු | 38 | 17.6349 |
| පළාත් පාලන | 15 | 6.7867 |
| බලශක්ති | 9 | 20.2071 |
| අනෙකුත් පොදු කටයුතු | 31 | 1200.589 |
| **එකතුව** | | **1297.2771** |

### 1.2.2. 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

වගුව: 04.

| ක්‍රියාකාරකම් | වටිනාකම (රු. මිලියන) |
|---|---|
| නාගරික සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 70.24 |
| පහත් බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 630 |
| ගම් පුළුල් කිරීමේ කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 862.31 |
| ආරක්ෂක කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 1701.49 |
| වාරිමාර්ග කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 29.5 |
| අධ්‍යාපන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 63.36 |
| ධීවර කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 30 |
| සෞඛ්‍ය කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 18 |
| වන සම්පත්, වනජීවී කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 350 |
| ස්වදේශ කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 110.97 |
| අධිකරණ කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 106 |
| කෘෂිකාර්මික කටයුතුසඳහා ඉඩම් අත්කර ගැනීම | 420 |
| තැපැල් කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 102.5 |
| වෙනත් කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 90.63 |
| පරිපාලන වියදම් | 15 |
| එකතුව | 4600 |

## 1.3. ඉඩම් ප්‍රතිපත්ති අංශය

ඉඩම් විෂයට අදාළ අණ පනත්, රෙගුලාසි, නියෝග හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ සංශෝධනය කිරීම.

### 1.3.1 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය

වගුව: 05.

| අනු අංකය | වැඩසටහන | ඉලක්කය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|
| 1. | 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥාපනත | රෙගුලාසි සංශෝධනය කිරීම | මෙම පනතේ වාණිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් බදුදීමේ කාලය වසර 50 සිට 99 දක්වා දීර්ඝ කිරීමට අදාල රෙගුලාසිය සංශෝධනය සිදුකර ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන එය අංක 2392/46 හා 2024.07.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කර ඇත. |
| 2. | 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත | පනත සංශෝධනය කිරීම | නීති කෙටුම්පත් සම්පාදක සමඟ සාකච්ඡා කරමින් අවසන් පනත් කෙටුම්පත සකස් කරමින් පවතී. |
| 3. | 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කිරීමේ පනත | පනත සංශෝධනය | 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කිරීම පනතේ සංශෝධන කිරීමට අදාළව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධිත පනත් කෙටුම්පත සකස් කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| 4. | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත | රෙගුලාසි සංශෝධනය කිරීම | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අදාළව රෙගුලාසි සංශෝධනය අංක 2308/27 හා 2022.12.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කර ඇති අතර එය 2024.06.18 දින පාර්ලිමේන්තුවෙදී අනුමත විය. |
| 5. | 2002 අංක 17 දරන මැනුම් පනත | රෙගුලාසි සංශෝධනය කිරීම | නීති කෙටුම්පත් සම්පාදක විසින් යොමු කරන ලද කෙටුම්පත සඳහා වන එකඟතාවය, නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත. |
| 6. | ජාතික ඉඩම් කොමිෂන් සභා පනත | පනත සම්පාදනය කිරීම | නව වැනි පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙර, පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත් සමඟ න්‍යාය පත්‍රයෙන් ඉවත්වන බැවින්, මෙම පනත් කෙටුම්පත අභිනව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලෙස පාර්ලිමේන්තු සභානායක ලේකම් විසින් දන්වා ඇත . ඒ අනුව, "ජාතික ඉඩම් කොමිෂන් සභාව පනත් කෙටුම්පත අභිනව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම" මැයෙන් සකස් කරන ලද නව අමාත්‍ය මණ්ඩල සංදේශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |
| 7. | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් පනත සම්පාදනය කිරීම | පනත සම්පාදනය කිරීම | "ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තු පනත කෙටුම්පත් කිරීම" මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

### 1.3.2. 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

- 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතට අදාළව රෙගුලාසි සංශෝධනය කිරීම
- 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනය කිරීම
- 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කිරීමේ පනත සංශෝධනය කිරීම
- 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම
- 2002 අංක 17 දරන මැනුම් පනතට අදාළව රෙගුලාසි සංශෝධනය කිරීම
- ජාතික ඉඩම් කොමිෂන් සභා පනත සම්පාදනය කිරීම
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් පනත සම්පාදනය කිරීම

## 1.4. ව්‍යාපෘති අංශය

බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ දෙපාර්තමේන්තු සහ ආයතන සම්බන්ධීකරණ කටයුතු හා ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කරයි.

### 1.4.1. 2024.01.01 සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය

වගුව: 06.

| අනු අංකය | ව්‍යාපෘතිය හා ආයතනයේ නම | | | 2024 භෞතික ඉලක්ක | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1) | බිම් සවිය | • මිනින්දෝරු දෙපාර්තමේන්තුව- මැනුම් කරන ලද මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව | | 87,160 | 115,494 |
| | | • ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - ○ 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමැතියෙන් පසු එවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව | | 150,000 | 86,095 |
| | | • රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව- ○ නිකුත් කරන ලද හිමිකම් සහතික සංඛ්‍යාව ○ ලියාපදිංචි කරන ලද උපලේඛන සංඛ්‍යාව | | 150,000 | 11,075<br>50,486 |
| | | • ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | | | |
| | | | ඉඩම් කච්චේරි | 50 | 0 |
| | | | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දුන් බලපත්‍ර | 1,000 | 1 |
| | | | කැඩැස්තර සිතියම් යටතේ නිකුත්කර ඇති දීමනා පත්‍ර | 1,500 | 3,857 |
| | | | ජංගම සේවා | 30 | 0 |
| | | | කොට්ඨාශ දින | 25 | 7 |
| | | | ගැටළු විසදීම | 3,500 | 486 |

### 1.4.2. 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

වගුව: 07.

| අනු අංකය | ව්‍යාපෘතිය හා ආයතනයේ නම | | 2025 භෞතික ඉලක්ක | 2025 මූල්‍ය ඉලක්ක (රු) |
|---|---|---|---|---|
| 1) | බිම් සවිය | • මිනින්දෝරු දෙපාර්තමේන්තුව- මැනුම් කරන ලද මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව | • 144,000 | • 874,000,000 |
| | | • ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමැතියෙන් පසු එවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව | • 104,000 | • 398,535,000 |
| | | • රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව- නිකුත් කරන ලද හිමිකම් සහතික සංඛ්‍යාව ලියාපදිංචි කරන ලද උපලේඛන සංඛ්‍යාව | • 104,000 | • 106,100,000 |
| | | • iv. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | | |

| | | | | |
|---|---|---|---|---|
| | | ➢ ඉඩම් කච්චේරි | 250 | 2,500,000 |
| | | ➢ කැඩැස්තර සිතියම් යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍ර | 7000 | |
| | | ➢ ජංගම සේවා | 6500 | |
| | | ➢ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 3250 | |

## 1.5. පාලන අංශය

පාලන අංශය මගින් අමාත්‍යාංශයේ (ඉඩම් අංශය) යටතේ පවතින දෙපාර්තමේන්තුවල හා මෙම අමාත්‍යාංශයේ ඉඩම් අංශයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පරිපාලනමය කටයුතු හා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

### 1.5.1. 2024.01.01 සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය.

**වගුව: 08.**

| අනු අංකය | වැඩ සටහන/ ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|---|
| 01. | මානව සම්පත් සංවර්ධනය | විෂය පථයන් 4ක් යටතේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම/ පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම.<br><br>නිලධාරී සංඛ්‍යාව - 140 | පවත්වා ඇති පුහුණු වැඩසටහන් සංඛ්‍යාව -25<br><br>පුහුණුව ලද නිලධාරීන් සංඛ්‍යාව - 94 (ජ්‍යෙෂ්ඨ, ද්විතියික, ප්‍රාථමික මට්ටම)<br>01.දෙමළ භාෂාව සම්බන්ධ පුහුණුව<br>02. රියදුරු පුහුණු වැඩසටහන්<br>03. සේවා අවශ්‍යතාවය මත සම්පූර්ණ කල යුතු පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කර ඇත. | 710,974.00 |

### 1.5.2. 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

**වගුව: 09.**

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ඉලක්කය | මූල්‍ය ඉලක්කය (රු.) |
|---|---|---|---|
| 01. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම පරිදි පුහුණු අවශ්‍යතා හඳුනාගෙන කාර්ය මණ්ඩලය වෙත පුහුණුව ලබා දීම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - 30<br><br>නිලධාරින් සංඛ්‍යාව - 145 (ජ්‍යෙෂ්ඨ, ද්විතියික, ප්‍රාථමික මට්ටම) | 1652500.00 |

## 1.6. ගිණුම් අංශය

අමාත්‍යාංශයේ ඉඩම් අංශයට වෙන්වන මූල්‍ය ප්‍රතිපාදන වඩාත් ඵලදායි ලෙස හා විනිවිදභාවයෙන් යුතුව කළමනාකරණය කිරීම ගිණුම් අංශය මඟින් සිදුකරනු ලබයි. මෙහිදී , වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම, ගෙවීම් කටයුතු, ප්‍රසම්පාදන කටයුතු, වත්කම් කළමනාකරණය හා නිවැරදි මූල්‍ය වාර්තාකරණ කටයුතු සිදුවේ.

### 1.6.1. 2024.01.01 සිට 2024.12. 31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය

**වගුව: 10.**

| විස්තරය | ප්‍රතිපාදන -2024 (රු) | වියදම (රු) | ශේෂය (රු) | වියදම (%) |
|---|---|---|---|---|
| මෙහෙයුම් වියදම් | | | | |
| පුනරාවර්තන වියදම් | 567,195, 000.00 | 526,425,473.69 | 40,769,526..31 | 92.81% |
| ප්‍රාග්ධන වියදම් | 15,000,000.00 | 12,773,286.85 | 2,226,713.15 | 85.15% |
| එකතුව | **582,195, 000.00** | **539,198,760.54** | **42,996,239.46** | **92.61%** |
| සංවර්ධන වියදම් | 10,000,000,000.00 | 3,300,405,891.56 | 6,699,594,108.44 | 33% |
| මුළු එකතුව. | **10,582,195,000.00** | **3,839,604,652.10** | **6,742,590,347.90** | **36.28%** |

## 1.7. ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

කාර්යභාරය

මෙම මණ්ඩලය විසින් සිදුකරනු ලබන්නේ, රජයට අත්පත් කර ගන්නා ලද ඉඩමට අදාළ අත්කර ගැනීමේ නිලධාරී/ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් ලද 17 වගන්තිය ප්‍රකාරව එම වන්දි ප්‍රදානය සඳහා අදාළ පුද්ගලයන් එකඟ නොවේ නම් පමණක්, එම වන්දි මුදල ලබා නොගෙන එය ලැබී දින 21 ක් ඇතුළත අදාළ පුද්ගලයාගේ අත්සනින් යුතුව මෙම මණ්ඩලය වෙත එවනු ලබන අභියාචනා, අභියාචනා මණ්ඩලය ඉදිරියෙහි විමසීම් කර නියෝග ලබාදීමය.

**අභියාචනා මණ්ඩලය**

ගරු ජනාධිපතිතුමා විසින් වසර 03 ක කාලසීමාවකට යටත්ව පත්කරනු ලබන මණ්ඩලයක් විසින් මෙම අභියාචනාවන් විභාග කරනු ලබයි.

අභියාචන මණ්ඩලයේ සංයුතිය

- සභාපති
- උප සභාපති
- නීති සාමාජිකයින් 08
- තක්සේරු සාමාජිකයින් 08

### 1.7.1. 2024.01.01 සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය

**වගුව: 11.**

| විභාග කරන ලද අභියාචනා සංඛ්‍යාව | විසඳුම් ලබාදී ඇති අභියාචනා ප්‍රමාණය | අභියාචනා මණ්ඩලය රැස්වූ වාර ගණන |
|---|---|---|
| 1819 | 245 | 175 |

# 02. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පැරණිතම දෙපාර්තමේන්තුව ලෙස වසර 224 ක් තුළ රටේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මැනුම් කටයුතු සිදු කිරීම මෙන්ම, ආරක්ෂක කටයුතු, අධ්‍යාපනික කටයුතු සහ පොදු මහජන භාවිතය සඳහා අවශ්‍ය වන සිතියම්,1:50,000 හා 1:10,000 සිතියම් මාලාව සැකසීම සහ යාවත්කාලීන කිරීමේ ජාතික අවශ්‍යතාව ඉටු කිරීම මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය වන අතර, සංවර්ධනයේ නිහඬ පෙරගමන්කරු යන්න මනාසේ අර්ථවත් වන ලෙස ක්‍රියාත්මක වෙමින් ප්‍රශංසාත්මක මෙහෙවරක් මේ දක්වාම ඉටු කරමින් සිටී.

## කාර්යයන්

- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ හා රජයේ ඉඩම් ආඥා පනත යටතේ ව්‍යවස්ථාපිත මැනුම් කර දීමනා පත්‍ර ලබා දීමට රේඛා චිත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකිරීම

- අධිවේගී මාර්ග, මාර්ග පුළුල් කිරීම, ගුවන් තොටුපල, ධීවර වරාය ආරම්භ කිරීම, සංචාරක ව්‍යාපෘති, බල ශක්ති ව්‍යාපෘති වැනි අතිවිශාල සංවර්ධන යෝජනා ක්‍රම සඳහා මූලික අවශ්‍යතාවයන් වන ඉඩම් මැනීම සහ අත්කරගැනීමේ මැනුම් කටයුතු සිදුකිරීම

- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිවයිනේ පිහිටි සියලුම රජයේ හා පෞද්ගලික ඉඩම් මැනීම් කර කැඩැස්තර සිතියම් සකස් කිරීම.
- කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා සමාජීය ගැටලු විසඳීමටඅදාල තීරණ ගන්නා අංශයන් වෙත අවශ්‍ය භූමි තොරතුරු කාර්යක්ෂමව ලබාදීම සඳහා නවීන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් මැනුම් කිරීම.

- දිවයිනට බලපාන හදිසි ආපදා තත්වයන්හිදී ජනතාවට සහන සැලසීම සඳහා අවශ්‍ය භූමි තොරතුරු කාර්යක්ෂමව ලබා දීම.

- සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සඳහා නවතම තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි 2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ පැවරී ඇති බලතල අනුව,
  - මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි භූමිතික පාලන ලක්ෂ්‍ය පිහිටුවීම, පවත්වාගෙනයාම, වැඩිදියුණු කිරීම.
  - භූමි තොරතුරුරැස්කිරීම
  - අධිවිභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප, ආලෝක අනාවරණ හා පරාස තාක්ෂණය (LiDAR) මඟින් රැස් කරන දත්ත භාවිතා කරමින් 1:50,000 සහ 1:10,000 භූ ලක්ෂණාත්මක අංකිත දත්ත පද්ධති යාවත්කාලීන කිරීම.
  - භූමි තොරතුරු අවශ්‍ය පාර්ශවයන් සඳහා ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට ගබඩා කිරීම.
  - භූ ලක්ෂණාත්මක සිතියම්, තේමා සිතියම් හා පාරිභෝගික අවශ්‍යතා ඉටුකිරීම සඳහා වන සිතියම් සැකසීම.
  - සිතියම් හා සම්බන්ධ සියලු නිෂ්පාදන මුද්‍රිත හා අංකිත යන ආකාරවලින් මිලදීගැනීමට අවශ්‍ය පහසුකම් සලසාදීම.

- ජාතික සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය මහාමාර්ග, අධිවේගී මාර්ග පද්ධති වැඩි දියුණු කිරීම, ජලාශ ඉදිකිරීම් වැනි ව්‍යාපෘති හා විවිධ ආයතනවල අවශ්‍යතා සඳහා මැනුම් කිරීම.
- මහජන අවශ්‍යතා සඳහා ඉඩම් තොරතුරු ලබා දිය හැකියාවත් කාලීන වූ ඉඩම් තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනයාම.
- ශ්‍රී ලාංකීය ජනතාවගේ සංස්කෘතික උරුමය හා බැඳුණු ජාතික සමගියට අනුබල දෙන නිවැරදි සහ නිශ්චිත වූ භූගෝලීය නාම පද්ධතියක් හඳුන්වා දීම.
- අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිතා කිරීම හා හුවමාරු කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙල සකස් කිරීම.

## 2.1. 2024.01.01 සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය

### 2.1.1. මානව සම්පත් හා පාලන අංශයෙන් 2024 වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යයන්

- නීති නිලධාරී තනතුර සඳහා 01 අයෙකුත්, ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරී 1 ශ්‍රේණිය තනතුර සඳහා 01 අයෙකුත් බඳවාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.
- මිනින්දෝරු තනතුර සඳහා 108 දෙනෙකු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වමින් 2025 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී බඳවා ගැනීමට මූලික පියවර යොදා ඇත.
- දෙපාර්තමේන්තුවේ සිතියම් තාක්ෂණ නිලධාරී තනතුර සඳහා 43 දෙනෙකුත්, කාර්යාල කාර්ය සහායක සේවය සඳහා 10 දෙනෙකුත්, රියදුරු තනතුර සඳහා 6 දෙනෙකුත්, මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුර සඳහා 136 දෙනෙකුත් බඳවාගෙන ඇත.
- අධිලේඛන සංරක්ෂක තනතුරු 06 ක් අනුමත කරවා ගැනීමට හා රියදුරු පුරප්පාඩු සඳහා අනියම් පදනමින් බඳවා ගැනීමට අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- කාර්යාල සේවක සේවයේ නිලධාරීන් 47 දෙනෙකු සඳහාත්, රියදුරු මහතුන් 04 දෙනෙකු සඳහාත් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇත.
- දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂය තුළ 96 දෙනෙකුගේ විශ්‍රාම ගැන්වීම් කටයුතු සිදු කර ඇත.
- දෙපාර්තමේන්තුව සම්බන්ධ නීතිමය කටයුතු සහ අවශ්‍ය අවස්ථාවලදී නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම කාර්යක්ෂමව ඉටුකර ඇත.
- මේ වන විට දෙපාර්තමේන්තුව සතු වාහන සංඛ්‍යාව 326 කි. ඉන් 307 ක් පළාත් මට්ටමින් ද 19ක් ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව ද රාජකාරී කටයුතු සඳහා උපයෝගී වේ.

## 2.1.2 2024 වර්ෂයේ නිම කරන ලද මැනුම්

➢ **ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉටු කරන ලද මැනුම්**

- රජයේ කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ දීමනාපත්‍ර ලබා දීම සඳහා සිදු කරන ලද මැනුම්

➢ **රජයේ ඉඩම් ආඥා පනත යටතේ වෙනත් ආයතන සඳහා සිදු කරන ලද මැනුම්**

- රිදියගම කිරි ගොවිපල මැනුම්
- පාසල්, සුසාන භූමි, ක්‍රීඩාංගන වැනි පොදු අවශ්‍යතා සඳහා වූ මැනුම්

➢ **රජයේ සංවර්ධන කටයුතු සඳහා අත්කර ගැනීමේ මැනුම්**

- සුළං බලාගාර ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ මැනුම්
- මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා අත්කර ගැනීමේ මැනුම්
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලුම් කරන ලද අත්කර ගැනීමේ මැනුම්
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලුම් කරන ලද අත්කර ගැනීමේ මැනුම්
- ජල සම්පාදන ව්‍යාපෘති සඳහා අත්කර ගැනීමේ මැනුම්

➢ **මාර්ග සහ දුම්රිය මාර්ග සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීමේ මැනුම්**

- කුරුණෑගල - අනුරාධපුර දුම්රිය මාර්ගයේ කුරුණෑගල කොටසක මැනුම්
- කුරුණෑගල - හබරන දුම්රිය මාර්ග මැනුම්
- මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා අත්කර ගැනීමේ මැනුම්

➢ **කාලීන අවශ්‍යතා අනුව ඉටුකරන ලද වෙනත් මැනුම්**

- විල්පත්තු ජාතික උද්‍යාන ඉඩම් බැහැර කිරීමේ මැනුම්
- පහළ මල්වතුඔය ව්‍යාපෘතියට අදාළව අත්කර ගැනීමේ මැනුම්
- කොට්ටව වනයේ මායිම් ගල් දැමීමේ මැනුම්
- කටුනායක, රත්මලාන සහ මත්තල ගුවන් තොටුපලෙහි බාධක සමීක්ෂණය සඳහා වූ මැනුම්
- පුත්තලම අරුවක්කාලු ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ මැනුම්
- කොටියාගල අවශේෂ කැළෑ මැනුම්
- රිදියගම කිරි ගොවිපල මැනුම්
- මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකළ මැනුම්
- වතු මැනුම්
- වයඹ ඇළ ව්‍යාපෘතිය යටතේ සිදුකළ මැනුම්
- මිණිපේ ඇළ ව්‍යාපෘතිය යටතේ සිදුකළ මැනුම්
- බිම්සවිය යටතේ රජයේ මිනින්දෝරු හා බලයලත් මිනින්දෝරුවන් විසින් සිදුකළ මැනුම්
- නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සිදුවන සංවර්ධන ව්‍යාපෘති මැනුම්
- වාරි සෞභාග්‍යා මැනුම්
- සීගිරිය යාර 200 හා 400 ලකුණු කිරීම සඳහා සිදුකළ මැනුම්
- වෙසක් උත්සවයට සමගාමීව සිදුකළ උකුවෙල පුරාණ රජමහා විහාරය සඳහා පූජා භූමි ඔප්පු ලබා දීම සඳහා සිදුකළ මැනුම්
- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කන්දේගම ධනංජය රජමහ විහාර මැනුම්
- කොළොන්නාව වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ මැනුම්
- වේරැස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ මැනුම්
- මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය සම්බන්ධ මැනුම්
- උරුමය වැඩසටහන යටතේ ඉඩම් ඔප්පු ලබාදීම සඳහා රේඛා චිත්‍ර සැකසීම

- නකල්ස් මැනුම්
- පින්නවල සත්වෝද්‍යානය සඳහා අත්කර ගැනීමේ මැනුම්
- බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය
- තිස්ස විහාරයේ මැනුම්
- කන්කසන්තුරේ ජනාධිපති මන්දිරය අයත් ඉඩම් මැනුම්
- සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා සිදුකරන ලද මැනුම් (අරින්මා හෝල්ඩින්ස්)
- අම්පාර දිස්ත්‍රික්කයේ ගංවතුර හානි පිළිබඳ මැනුම්
- පුල්මුඩේ ඛනිජ වැලි සංස්ථාවට අදාල විස්තර මැනීම
- නැගෙනහිර පළාත් සංචාරක කලාපයට අදාල විස්තර හා ඩිජිටල් උන්නතාංශ ආකෘතිය (DEM)

### 2.1.3. ඉඩම් මැනුම් ප්‍රගතිය

වගුව: 12.

| මැනුම් වර්ගය | භෞතික ප්‍රගතිය | | | | | |
|---|---|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | | සමුච්චිතප්‍රගතිය 2024.12.31 දක්වා | | ප්‍රගතිය % | |
| | මිනින්දෝරු මාස | කැබලි | මිනින්දෝරු මාස | කැබලි | මිනින් දෝරු මාස | කැබලි |
| මායිම්ගල් දැමීමේ මැනුම් (ඉඩම් කට්ටි) | 1973 | 39460 | 2271 | 25422 | 115 | 64 |
| විවිධමැනුම් | 947 | 28410 | 1010 | 30300 | 107 | 107 |
| ඉඩම්අත්කර ගැනීමේ මැනුම් | 245.5 | 7365 | 119 | 3570 | 48 | 48 |
| ඉංජිනේරුමැනුම් (හෙකටයාර්) | 10 | 204 | 2 | 39 | 19 | 19 |
| උසාවිකොමිෂන් මැනුම් (කොමිෂන් පත්‍ර) | | 575 | | 544 | | 95 |

### 2.1.4. හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම්

වගුව: 13.

| මූල්‍ය | 2024 වර්ෂයට ඇස්තමේන්තුගත වියදම (රු.මිලියන) | 2024.12.31 දිනට වියදම (රු.මිලියන) | ප්‍රතිශතය |
|---|---|---|---|
| | 388.0 | 355.2 | 96.57% |

| භෞතික | 2024 වර්ෂයට ඇස්තමේන්තුගත කැබලි ගණන | 2024.12.31 දිනට නිම කල කැබලි ගණන | ප්‍රතිශතය |
|---|---|---|---|
| ර.මි | 33160 | 55273 | 166.6% |
| ලි.බ.මි. | 54000 | 49947 | 92.5% |

## 2.1.5 සිතියම්කරණ හා භූගෝලීය නාමකරණ කටයුතු

වගුව: **14.**

| | කාර්යය | ඒකකවර්ගය | වාර්ෂික ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|---|
| 1 | භූ ලක්ෂණාත්මක දත්ත පද්ධතිය ඇසුරෙන් 1:50,000සිතියම් මාලාවේ දෙවන සංස්කරණය යථාවත් කර, සිතියම් විද්‍යානුකූලව සකස් කිරීම, මුද්‍රණය කිරීම හා සිතියම්කරණ දත්ත පද්ධතිය පවත්වා ගෙන යාම. | සිතියම් ගණන | 24 | 20 | 83.3 |
| 2 | 1:10,000 පරිමාණයේ සිතියම්, විද්‍යානුකූලව සැකසීම සහ මුද්‍රණය | සිතියම් ගණන | 76 | 55 | 72.4 |
| 3 | වැව් හා ජලාශසිතියම්, පුරාවිද්‍යාත්මක සිතියම්,ශ්‍රී ලංකා මාර්ග සිතියම (සිංහල) ලෝක සිතියම(සිංහල), පළාත් සිතියම්, සංචාරක සිතියම, මාර්ග හා නගර සිතියම් සංග්‍රහය, ජාතික වනෝද්‍යාන සිතියම්,වෙනත් තේමා සිතියම් | සිතියම් ගණන | 19 | 20 | 105 |
| 4 | සේවා ප්‍රදේශ පෙන්වන සිතියම, ග්‍රාම නිලධාරී කොට්ඨාස සිතියම්, පාසල් සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේදී භාවිත කරන සිතියම්, හමුදාමය කටයුතු වලදී භාවිත වන ග්‍රිඩ් සිතියම්, පාරිභෝගික ඉල්ලීම් අනුව සිතියම් සැකසීම | සිතියම් ගණන | 300 | 244 | 81.3 |
| 5 | පාරිභෝගික ඉල්ලීම් මත, මුද්‍රිතහා ආංකිත සිතියම් නිකුත් කිරීම (කඩදාසි, ෆ්ලෙක්ස් ) | සිතියම් ගණන | 300 | 852 | 284 |
| 6 | පවතින භූගෝලීය නාමයන් මහජන අදහස් අනුව ප්‍රමිතිකරණය කිරීම. | භූගෝලීය නාමයන් ගණන | 600 | 549 | 91.5 |
| 7 | සිංහල සහ දෙමළ භාෂාවෙන් ඇති භූගෝලීය නාම තොරතුරු පද්ධතිය පිරිපහදු කිරීම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | 72 | 122 | 169.4 |
| 8 | රාජ්‍ය භාෂාවන්ට අමතරව රෝමානුකරණය කරන ලද භූගෝලීය නාමයන්ගේ අත්පිටපත් පවත්වාගෙන යාම. | රෝමානුකරණය කරන ලද භූගෝලීය නාමයන් ගණන | 600 | 286 | 47.7 |
| 9 | භූගෝලීය නාමකරණය පිළිබඳ පනත සහ රෙගුලාසි සැකසීම. | පැවරීම් | | - | - |
| 10 | පවතින භූගෝලීය නාමයන් ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීම. | භූගෝලීය නාම ගණන | 72000 | 80250 | 111.5 |
| 11 | ලිතෝ මුද්‍රණ කටයුතු | සිතියම්(තනි හා වර්ණ) | 23400 | 408165 | 233 |
| | | පොත්/ | 3000 | 6000 | 44 |
| | | පෝරම ප්‍රමාණය | 200166 | 136580 | 91 |

## 2.1.6. මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය

1969 අංක 21 දරණ පනත යටතේ ස්ථාපනය කරන ලද මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය 1990.07.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත යටතේ පිළිගෙන ඇත.

ආයතනික දැක්ම ලෙස ආසියානු කලාපයේ භූ තොරතුරු පිළිබඳ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයවීම පෙරදැරි කොට ක්‍රියාත්මක වන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මැනුම් විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධි පාඨමාලා, සිතියම් විද්‍යාව පිළිබඳ දෑවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලා, දුරස්ථ ග්‍රහණ ශිල්පය පිළිබඳ දෑ අවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලා, ගුවන් ඡායාරේඛණමිතිය පිළිබඳ දෑවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලා,පිඹුරුමුද්‍රණශිල්පය පිළිබඳ දෑවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලා, මැනුම්විද්‍යා උපාධිධාරීන් යොමුගත කිරීමේ සයමස් පාඨමාලාහා මැනුම් ක්ෂේත්‍ර සහයකවරුන් වෙනුවෙන් ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා පාඨමාලා (NVQ මට්ටම 2,3) යනාදී පාඨමාලා පැවැත්වේ. මෙයට අමතරව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා මැනුම් විද්‍යාව පිළිබඳ කෙටි කාලීන පුහුණු පාඨමාලා ද මෙම ආයතනය මගින් පවත්වනු ලබයි.

### 2.1.6.1 2024.12.31 දින වන විට පවත්වා ඇති පාඨමාලා පිළිබඳ විස්තර

වගුව: 15.

| | පාඨමාලා වර්ගය | ගණන |
|---|---|---|
| 01 | විද්‍යාවේදී උපාධි පාඨමාලා | 01 |
| 02 | දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා කෙටි කාලීන පාඨමාලා | 06 |
| 03 | අනෙකුත් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන සඳහා කෙටි කාලීන පාඨමාලා | 08 |
| 04 | අනෙකුත් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන සඳහා එක් දින පාඨමාලා | 38 |

## 2.1.7. 2024.01.01. දින සිට 2024.12.31 දින වන මූල්‍ය ප්‍රගතිය

### 2.1.7.1. ප්‍රාග්ධන වියදම්

වගුව: 16.

| වැඩ සටහන් නාමය | 2024 වර්ෂය සඳහා ලැබූ මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්) | 2024.12.31 දක්වා වියදම (රුපියල්) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මෙහෙයුම් කටයුතු, පරිපාලන හා ආයතනික සේවා (288-1-1) | 204,200,000.00 | 157,876,497.70 | 77 |
| සංවර්ධන කටයුතු හා මැනුම් කටයුතු (288-2-2) | 407,800,000.00 | 185,663,069.36 | 46 |
| සංවර්ධන කටයුතු හා මැනුම් පුහුණු කටයුතු (288-2-3) | 17,300,000.00 | 14,875,263.13 | 86 |
| බිම් සවිය .(122-2-3-4-2509) | 388,000,000.00 | 342,991,905.06 | 88.4 |

**2.1.7.2. පුනරාවර්තන වියදම්**

**වගුව: 17.**

| වැඩ සටහන් නාමය | 2024වර්ෂය සඳහා ලැබූ මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්) | 2024.12.31 දක්වා වියදම (රුපියල්) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මෙහෙයුම් කටයුතු, පරිපාලන හා ආයතනික සේවා (288-1-1) | 376,960,000.00 | 312,153,737.30 | 83 |
| සංවර්ධන කටයුතු හා මැනුම් කටයුතු (288-2-2) | 4,263,790,000.00 | 3,654,635,944.16 | 86 |
| සංවර්ධන කටයුතු හා මැනුම් පුහුණු කටයුතු (288-2-3) | 139,445,000.00 | 114,641,297.12 | 82 |

**මැනුම්පති ආදායම**

2024 **දෙසැම්බර් 31** දක්වා මැනුම් ගාස්තු, මුද්‍රිත හා සංඛ්‍යාංක සිතියම් අලෙවි කිරීම, සංඛ්‍යාංක දත්ත හා ගුවන් ඡායාරූප අලෙවි කිරීම, පිඹුරු පිටපත් අලෙවි කිරීම, පාලන ලක්ෂ්‍ය පිටපත් නිකුත්කිරීම යනාදියෙන් ලද මැනුම්පති ආදායම රු**. 403,843,914.31**

## 2.2. 2025 වර්ෂය සඳහා අපේක්ෂිත වැඩසටහන්

### 2.2.1 2025 වර්ෂයේ නිම කිරීමට බලාපොරොත්තු වන මැනුම්

- මහඔය රක්ෂිතය වෙන්කිරීමේ මැනුම්
- සෝමාවතිය ජාතික වනෝද්‍යාන මැනුම (2 අදියර)
- ජල ගැලුම් නිම්න ජාතික වනෝද්‍යාන මැනුම්
- පහළ මල්වතු ඔය ව්‍යාපෘතිය
- යාන්ඔය පසුකාලීන මැනුම්
- වැව්ගම් පුබුදුව වැඩසටහන යටතේ වැව් රක්ෂිත මැනුම් කිරීම
- පුරාවිද්‍යා රක්ෂිත භූමි මායිම් නැවත විවෘත කිරීම
- සුළං බලාගාර ඉදිකිරීම සඳහා වන ඉඩම් අත්කර ගැනීමේ මැනුම්
- නකල්ස් අත්කර ගැනීමේ මැනුම්
- කොළොන්නාව වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ මැනුම්
- බේරුස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ මැනුම්
- මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය සම්බන්ධ මැනුම්
- මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා අත්කර ගැනීමේ මැනුම්
- දකුණු පළාත් සභාවට අයත් පාසල් 500 ක ප්‍රමාණයක් මැනුම් කටයුතු සිදු කිරීම
- මත්තල ගුවන් තොටුපල විස්තර මැනීම
- මඩකලපුව ගුවන් තොටුපල විස්තර මැනීම

### 2.2.1.1 මැනුම් කටයුතු

**වගුව:18.**

| ක්‍රියාකාරකම | කාර්යය සාධන දර්ශකය | වාර්ෂික ඉලක්කය 2025 | F/P | කාර්තුමය භෞතික ඉලක්ක | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | Q1 | Q2 | Q3 | Q4 |
| **2.0 ජාතික අවශ්‍යතාවයන් සඳහා මැනුම් කිරීම** | | | | | | | |
| 2.1 ඉඩම් බෙදා දීම සඳහා සිදුකරනු ලබන ව්‍යවස්ථාපිත මැනුම් | | | | | | | |
| 2.1.1 ඉඩම් සංවර්ධන ආඥා පනත / රජයේ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ දීමනාපත්‍ර ලබාදීම සඳහා අවශ්‍ය මැනුම් සිදුකිරීම | ඉඩම්කට්ටි ගණන | 30300 | P | 7575 | 7575 | 7575 | 7575 |
| 2.1.2 1947අංක 08 දරණ රජයේ ඉඩම්ආඥා පනත යටතේ ඉඩම් පැවරීම | ඉඩම්කට්ටි ගණන | 16400 | P | 4100 | 4100 | 4100 | 4100 |
| 2.2 ඉඩම් අත්කර ගැනීමේපනත යටතේ සිදුකරන මැනුම් | | | | | | | |
| 2.2.1 අත්කර ගැනීමේ පනතේ 2 වැනි වගන්තිය යටතේසිදු කරන මැනුම් | ඉඩම්කැබලි ගණන | 5800 | P | 1450 | 1450 | 1450 | 1450 |
| 2.2.2 අත්කර ගැනීමේ පනතේ 6 වන හෝ 38(ඒ) වැනි වගන්තිය යටතේ සිදු කරන මැනුම් | ඉඩම්කැබලි ගණන | 6260 | P | 1565 | 1565 | 1565 | 1565 |
| 2.3 ව්‍යවස්ථාපිතනොවන වෙනත් මැනුම් | | | | | | | |
| 2.3.1. ඉංජිනේරු මැනුම් | හෙක්ටයාර් | 960 | P | 240 | 240 | 240 | 240 |
| 2.3.2. විවිධ මැනුම් -මැනුම් ඉල්ලීම්ටඅදාලවමැනුම් සිදු කර අනුරේඛණහාවාර්තාසැකසීම | ඉඩම්කැබලි ගණන | 22740 | P | 5685 | 5685 | 5685 | 5695 |
| 2.4 උසාවි මැනුම් | | | | | | | |
| 2.4.1 උසාවි කොමිෂන්පත්‍රයට අදාලමැනුම් ඉල්ලීම් ක්‍රියාත්මකකර අනුරේඛණ හා වාර්තා සැකසීම | කොමිෂන්පත්‍ර ගණන | 772 | P | 193 | 193 | 193 | 193 |
| 4.0 හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ මැනුම් කටයුතුකිරීම | | | | | | | |
| 4.1.1 රජයේ මිනින්දෝරුවන් විසින් කැඩැස්තර සිතියම්පිළියෙල කර ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත භාර දීම | ඉඩම්කැබලි ගණන | 72000 | P | 18000 | 18000 | 18000 | 18000 |
| 4.1.2 බලයලත් මිනින්දෝරුවන් විසින්කැඩැස්තර සිතියම්පිළියෙල කර ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත භාර දීම | ඉඩම්කැබලි ගණන | 72000 | P | _ | 12000 | 24000 | 36000 |
| 4.2 අතිරේක මැනීම | මැනුම් ඉල්ලීම්සංඛ්‍යාව | 500 | P | 125 | 125 | 125 | 125 |
| 4.3 අතුරු බෙදීම හෝ ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක කිරීම | ඉල්ලීම්ගණන | 10000 | P | 2500 | 2500 | 2500 | 2500 |
| 4.4 මැනුමකට අදාළ ගැටළු විසඳීම | ගැටළු ගොනු ගණන | 400 | P | 100 | 100 | 100 | 100 |

## 2.2.1.2 හිමිකම් ලියාපදිංචිකිරීමේ මැනුම්

වගුව: 19.

| ව්‍යාපෘතිය | ඉලක්කය ඒකකය - බිම්කැබලි | යෙදවීම | |
|---|---|---|---|
| | | මානව | මුල්‍ය - රු.මිලියන |
| බිම්සවිය | 58320 | බිම්සවිය සඳහා අනුයුක්ත රජයේ මිනින්දෝරුවන් 162 | 130 |
| | 72000 | ලියාපදිංචිබලයලත්මිනින්දෝරුවන් 125 | 462 |
| එකතුව | 130320 | | 592 |

## 2.2.1.3 සිතියම්කරණ හා භූගෝලීය නාමකරණ කටයුතු

වගුව: 20.

| | කාර්යය | ඒකකවර්ගය | ඉලක්කය |
|---|---|---|---|
| 1 | භූ ලක්ෂණාත්මක දත්ත පද්ධතිය ඇසුරෙන් 1:50,000 සිතියම් මාලාවේ දෙවන සංස්කරණය යථාවත් කර, සිතියම් විද්‍යානුකූලව සකස් කිරීම, මුද්‍රණය කිරීම හා සිතියම්කරණ දත්ත පද්ධතිය පවත්වා ගෙන යාම | සිතියම් ගණන | 24 |
| 2 | 1:10,000 පරිමාණයේ සිතියම් විද්‍යානුකූලව සැකසීම, මුද්‍රණය සහ සිතියම්කරණ දත්ත පද්ධතිය පවත්වාගෙනයාම | පත්‍ර ගණන | 108 |
| 3 | පාරිභෝගික ඉල්ලීම් මත, 1:10,000සිතියම් විද්‍යානුකූලව සැකසීම සහ මුද්‍රණය | ඉල්ලීම් ගණන | 72 |
| 4 | දැනට පවතින සිතියම් විද්‍යාත්මකව වැඩිදියුණු කරන ලද අවකාශීය දත්ත සමුදාය සහ අදාළ දෙපාර්තමේන්තු සහ ආයතනවලින් ලැබෙන ද්විතියික තොරතුරු භාවිතා කරමින් නගර සිතියම්, ඓතිහාසික සිතියම් සහ අනතුරුදායක ප්‍රදේශ සිතියම් සකස්කිරීම සහ නව තේමා සිතියම් සැකසීම (ජාතික සිතියම් සංග්‍රහය ඇතුළුව) | සිතියම් ගණන | 22 |
| 5 | පාරිභෝගික ඉල්ලීම් මත, මුද්‍රිත සහ අංකිත සිතියම් සකස් කිරීම (කඩදාසි, ෆ්ලෙක්ස්) | සිතියම් ගණන | 240 |
| 6 | පාරිභෝගික ඉල්ලීම් මත සිතියම් මුද්‍රණය කිරීම (ෆ්ලෙක්ස්) | සිතියම් ගණන | 120 |
| 7 | පවතින භූගෝලීය නාමයන් මහජන අදහස් අනුව ප්‍රමිතිකරනය | භූගෝලීය නාමයන්ගණන | 600 |
| 8 | භූගෝලීය නාම දත්ත පද්ධතියේ ජලවහනය හා මාර්ග අශ්‍රිතව පවතින නාමකරණයන් සිංහල හා ද්‍රවිඩ භාෂාවෙන් යාවත්කාලීන කිරීම. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | 72 |
| 9 | රාජ්‍ය භාෂාවන්ට අමතරව රෝමානුකරනය කරන ලද භූගෝලීය නාමයන්ගේ අත්පිටපත් පවත්වා ගෙන යාම | රෝමානුකරණය කරන ලද භූගෝලීය නාමයන් ගණන | 600 |
| 10 | පවතින භූගෝලීය නාමයන් දෙමළ බස සිංහලට/දෙමළ බස ඉංග්‍රීසි බසට/සිංහලබසදෙමළ බසට පරිවර්තනය කිරීම | භූගෝලීය නාමයන් ගණන | 36000 |
| 11 | ලිතෝ මුද්‍රණ කටයුතු | සිතියම්/ පොත්/ පෝරම ප්‍රමාණය | 35800/ 2000/ 138580 |

### 2.2.4 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

- දෙපාර්තමේන්තුගත තනතුරු පුරප්පාඩු වෙනුවෙන් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් අනුමත කරවාගැනීම්, නිවේදන පළකිරීම්, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, පත්වීම් ලිපි ප්‍රදානය කිරීම හා අනුයුක්ත කිරීමේ කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ නිලධරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම්, සේවයේ ස්ථිර කිරීම්, වැටුප් වර්ධක ගෙවීම්, කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ කටයුතු, විශ්‍රාම ගැන්වීම්, ඉල්ලා අස්වීම්, නැවත සේවයේ පිහිටුවීම්, නිවාඩු සම්බන්ධ කටයුතු, ස්ථාන මාරු සම්බන්ධ කටයුතු හා විනය ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම
- දීප ව්‍යාප්ත සේවා හා ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් පුරප්පාඩු වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට කටයුතු කිරීම
- දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධව කටයුතු කිරීම
- මානව සම්පත් කළමනාකරණ කටයුතු වෙනුවෙන් අනෙකුත් රාජ්‍ය ආයතන හා වෘත්තීය සමිති සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

# 03. ඉඩම් මැනුම් සභාව

## හැඳින්වීම

මුදල් අමාත්‍යාංශයෙහි පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා ඉඩම් විෂය භාර අමාත්‍යාංශයෙහි ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ඉඩම් මැනුම් සභාව, 2002 අංක 17 දරන මැනුම් පනතෙහි II කොටසෙහි 26 වැනි වගන්තිය ප්‍රකාරව 2003 මාර්තු මස කොළඹ 05, බර්නාඩ් ද සොයිසා මාවත, අංක 150 දරණ ලිපිනයේ පිහිටා තිබෙන සර්වේයර් ජනරාල් කාර්යාල පරිශ්‍රයේදී ආරම්භ කර ඇත.

## කාර්යයන්

- ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වාගෙනයාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය විනය පවත්වාගෙන යාම.
- ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාර ගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.
- වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර බාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.
- ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙනයාම ප්‍රවර්ධනය කිරීම.
- මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරිමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.
- ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදි සම තත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යෝන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර හා ක්‍රියාත්මක කිරීම.
- නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තීමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම.

## 3.1. 2024.01.01 සිට 2024.12.31 දින දක්වා ප්‍රගතිය

**භෞතික ප්‍රගතිය** **වගුව: 21.**

| | විස්තරය | 2024.12.31දිනට අයදුම් පත්‍ර ගණන | ප්‍රතික්ෂේපිත | 2024.12.31 දිනට ප්‍රගතිය | ඉතිරිය |
|---|---|---|---|---|---|
| 1 | ලියාපදිංචිය ලබා දීම | 12 | 03 | 09 | 0 |
| 2 | වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම | 916 | 26 | 890 | 0 |
| 3 | මහජන පැමිණිළි විමර්ෂණය කිරිම | 204 | - | 27 | 177 |

**මූල්‍ය ප්‍රගතිය** **වගුව: 22.**

| විස්තරය | ආදායම /රුපියල් | වියදම/රුපියල් | | මුළු වියදම/ රුපියල් |
|---|---|---|---|---|
| | | ප්‍රාග්ධන | පුනරාවර්තන | |
| ඇස්තමේන්තුව | **10,695,500.00** | **727,250.00** | **11,595,506.00** | **12,322,756.00** |
| 2024.12.31 දක්වා සත්‍ය ආදායම්/වියදම් | 10,519,676.00 | 594,343.00 | 7,628,081.00 | **8,222,424.00** |
| ප්‍රතිශතය | **98%** | **82%** | **66%** | **67%** |

## 3.2. 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

2002 අංක 17 දරණ මැනුම් පනතෙහි 37 (ආ) වගන්තිය අනුව ශාස්ත්‍රීය සුදුසුකම් සපුරාලන අය සඳහා ලියාපදිංචිය ලබා දීම මැනුම් සභාවේ ප්‍රධානම කාර්යයකි.

- මැනුම් සභාව ආරම්භයේ සිට, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ආධුනික මිනින්දෝරුවරුන් හැරුණු කොට මැනුම් විද්‍යා උපාධිධාරීන් හට එලෙස ලියාපදිංචිය ලබා දීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදීමට මේ දක්වා නොහැකි වී ඇත. කෙසේ වුවද 2022.07.05 දිනැති අංක අමප/22/0838/517/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 2023 වර්ෂය ආරම්භයේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා එක්ව ලියාපදිංචිය සඳහා අවශ්‍ය ප්‍රායෝගික අවශ්‍යතාවය ලබා ගැනීමට අපේක්ෂිත මැනුම් උපාධිධාරින් සඳහා වැඩසටහන් 2024 වර්ෂය වෙනුවෙන් ද ක්‍රියාත්මක කර ඇති අතර, 2025 වර්ෂය වෙනුවෙන්ද ක්‍රියාත්මක කිරීමට නියමිතය. මැනුම් පනත ප්‍රකාරව ලියාපදිංචි වීමේ අවස්ථාව තව දුරටත් පුළුල් කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදනය 2024.12.27 දින ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධියට පත් කර ඇත.

- 2025 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු පාඨමාලාවන් 12 පැවැත්වීම සඳහා සැලසුම් කර ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු ඉඩම් මැනුම් සභාවේ වෙබ් අඩවිය මඟින් දක්වා ඇත. ඒ අනුව 2025 වර්ෂයෙහි ද මැනුම් සභාව හෝ මැනුම් සභාවේ අවසරය මත වෙනත් ආයතන විසින් පවත්වනු ලබන අඛණ්ඩ වෘත්තීය පුහුණු වැඩසටහන්, පාඨමාලාවන් සභාව විසින් නිකුත් කරනු ලබන නිර්ණායකයන්ට හා නියමිත ප්‍රමිතීන්ට අනුව පැවැත්වීමට කටයුතු කර ඇත.
- මැනුම් සභාව සඳහා කඩිනමින් මාර්ගගත ගෙවීම් ක්‍රමවේදයක් සහිත පරිගණක කළමණාකරණ මෙහෙයුම් පද්ධතියක් ඇති කිරීම හා දැනට පවතින වෙබ් අඩවිය තත්වයෙන් උසස් කිරීම (මේ වන විට ඒ සඳහා අවශ්‍ය මූලික සාකච්ඡා වාර දෙකක් පවත්වා ඇත.)
- ඉදිරියේදී මැනුම් විද්‍යා උපාධිධාරීන් සඳහා ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය හා බලපත්‍ර ලබාදීම සම්බන්ධව පවතින බාධාවන් ඉවත් කිරීම සඳහා මැනුම් පනත සංශෝධනය කිරීමට නියමිතය.

# 04. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනතින් ස්ථාපිත කර ඇති ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඉඩම් පරිපාලනයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කරයි.

## කාර්යයන්

- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම හා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම.
- රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම යටතේ,
    - නිවාස, කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීම.
    - විශේෂ හා නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම.
    - විහාරස්ථාන සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කිරීම.
    - රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම, බදු දීම හා පැවරීම.
- ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදාදීම හා දීමනාපත්‍ර නිකුත් කිරීම.
- රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් හා රක්ෂිත ආරක්ෂා කිරීම.
- අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති වලින් බැහැර රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම.
- රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණය කිරීම.
- රාජ්‍ය බදු ආදායම් ශක්තිමත් කිරීමට රජයේ ඉඩම් මත බදු අයකර ගැනීම කළමනාකරණය කිරීම.
- මානව සම්පත් සංවර්ධන කටයුතු පවත්වා ගෙනයාම.
- ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම.

## 4.1. 2024.01.01 දින සිට 2024.12.31දින දක්වා භෞතික ප්‍රගතිය

**වගුව: 23.**

| අංකය | ක්‍රියාකාරකම් | | ඉලක්කය | සමස්ථ ප්‍රගතිය | සමස්ථ ප්‍රගතිය(%) |
|---|---|---|---|---|---|
| **1** | **ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ** | | | | |
| i | බලපත්‍ර සකස් කිරීම (අන්තර් පළාත්) | ගොවි පන්තිය | 6000 | 1877 | 31.28 |
| | | ගැණුම් මිල | 600 | 431 | 71.28 |
| | බලපත්‍ර සකස් කිරීම (පළාත් සභා) | ගොවිපන්තිය | 28000 | 16238 | 57.83 |
| | | ගැණුම් මිල | 3600 | 1266 | 35.17 |
| ii | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම | | 2000 | 15 | 0.75 |
| iii | දීමනාපත්‍ර පසු කටයුතු (පසු උරුමය නම් කිරීම, මුල් අයිතිය සහතික කිරීම, දීමනාපත්‍ර බැහැර කිරීම, උකස් කිරීම, කොන්දේසි ලිහිල් කිරීම) | | 3000 | 1878 | 62.60 |
| iv | මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම | | 100 | 54 | 54.00 |
| **2** | **රජයේ ඉඩම් ආඥා පනත යටතේ** | | | | |
| i | බදු පදනම මත ඉඩම් ලබා දීම | බදු නිර්දේශ සකස් කිරීම | 2300 | 2837 | 123.35 |
| | | බදුකර සකස් කිරීම | 500 | 517 | 103.40 |
| ii | නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම | | 800 | 937 | 117.13 |
| iii | රජයේ ආයතන සඳහා ඉඩම් නිදහස් කිරීම | පැවරුම් නියෝග | 450 | 70 | 15.55 |
| | | දෙපාර්තමේන්තු සඳහා ඉඩම් නිදහස් කිරීම | 750 | 650 | 86.66 |
| iv | පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර | | 40000 | 22138 | 55.35 |
| v | නාගරික සංවර්ධන අධිකාරිය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් පැවරීම (දීමනා පත්‍ර) | | 20 | 29 | 145.00 |
| vi | පූජා භූමි දීමනා පත්‍ර සකස් කිරීම (බෞද්ධ විහාරස්ථාන) | | 50 | 32 | 64.00 |
| vii | සුනාමි දිමනාපත්‍ර සකස් කිරීම | | 100 | 145 | 145.00 |
| **3** | **ඉඩම් ප්‍රදාන විශේෂ විධි විධාන පනත යටතේ** | | | | |
| i | නියාදන සාදන පත්‍ර සකස් කිරීම | | 50 | 17 | 34.00 |
| **4** | **ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම** | | 200 | 13 | 6.50 |
| **5** | **කච්චේරි පැවැත්වීම** | | 375 | 36 | 9.60 |
| **6** | **ගැටළු වලට උපදෙස් ලබා දීම හා ගැටළු නිරාකරණය** | | 15000 | 7674 | 51.16 |
| **7** | **පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම** | | 50 | 40 | 80.00 |
| **8** | **රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කිරීම** | | 70000 | 118693 | 169.56 |

### 4.1.1. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය

**වගුව: 24.**

| වියදම් ශීර්ෂය | 2024 අයවැයඇස්තමේන්තුව | 6% ප්‍රතිපාදන කපා හැරීම් | සංශෝධිත ඇස්තමේන්තුව | මුළු ශුද්ධ වියදම | මුළු ශුද්ධ වියදම (%) |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 634,200,000.00 | - | 680,960,000.00 | 583.488,202.00 | 86% |
| මූලධන වියදම | 70,000,000.00 | - | 70,000,000.00 | 33,212,818.00 | 47% |
| මුළු එකතුව | 704,200,000.00 | - | 750,960,000.00 | 616,701,020.00 | 82% |

## 4.2. 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

- මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) මඟින් බදු එකතු කිරීම සඳහා E- Slims පද්ධතිය වැඩි දියුණු කිරීම.
- කෙටිකාලයක් තුළ හිඟබදු අයකර ගැනීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්වරුන් /අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන් දැනුවත් කර වැඩපිළිවෙලක් සකස් කිරීමට පියවර ගෙන ඇත.

# 05. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ පිහිටි ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව කඩිනමින් සිදු කිරීමේ අරමුණින් 1903 වර්ෂයේදී ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. 1931 අංක 20 දරණ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ වූ ඉඩම් නිරවුල් කිරීමේ කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීමත් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ වූ ඉඩම් කොටස් පිළිබඳ හිමිකම් විමර්ශනය කර ලියාපදිංචි කිරීමේ කාර්යයත් මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

## කාර්යයන්

දෙපාර්තමේන්තුව සතු මූලික කාර්යයන් පහත දැක්වේ.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සහ කාර්යාලයීය පරිපාලනය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ක්‍රමවේදයන් සහ පටිපාටි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් නිරවුල් කිරීමට අදාළ කටයුතු වන
  - නිරවුල් කිරීමේ උරුම විභාග පැවැත්වීම
  - නිරවුල් කරන ලද ඉඩම් මැන වෙන් කිරීමට යැවීම
  - නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම
  - නිරවුල් කිරීමේ අවසාන වාර්තාව සැකසීම
  - නිරවුල් කිරීමෙන් පසු ගම් නිදහස් කිරීම
- ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම
  - ඉඩම් කොටස් සඳහා කැඩැස්තර සිතියම් සකස් කිරීමට ඉල්ලීම් කිරීම.
  - කැඩැස්තර සිතියම් මඟින් ඉඩම් කොටස් සඳහා හිමිකම් පෑමට දැන්වීම් කිරීම.
  - හිමිකම් විමර්ශනය කර, හිමිකම් තීරණය කිරීම හා ගැසට් කිරීම.
- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතුවල දී අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- කාර්ය මණ්ඩලයේ රාජකාරි කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සම්පත් අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපයා දීම.
- හිමිකම් විමර්ශන කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා කාර්ය සාධන දර්ශක සැකසීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.
- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතුවල ප්‍රගතිය මාසිකව වාර්තා කිරීම.
- ඉඩම් නිරවුල් කිරීමට අදාළ පැරණි සහ වටිනා ලේඛන සංරක්ෂණය කිරීම සඳහා ලේඛන සංරක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම.
- හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ මහජන අවබෝධය වර්ධනය කිරීම සහ සහයෝගය ලබාගැනීම පිණිස දැනුවත් කිරීමේ රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම.
- ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය පවත්වාගෙනයාම සහ ඔවුන්ට අවශ්‍ය සම්පත් ලබාදීම මඟින් මහජන අවශ්‍යතා සපුරාගැනීමට අවකාශ සැලසීම.

- අත්තිකාරම් ගිණුම්, විසර්ජන ගිණුම්, රජයේ නිලධාරින්ගේ ඇස්තමේන්තු ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සැකසීම.

## 5.1 2024.01.01 සිට 2024.12.31 දිනට බිම්සවියට අදාළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

**(1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත)**

**වගුව: 25.**

| අනු අංකය | විස්තරය | 2024 ඉලක්ක (ඉඩම් කැබලි) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | 12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා එවා ඇති කඩයිම් සිතියම්වල අඩංගු ඉඩම් කැබලි සංඛ්‍යාව | 100,000 | 110,085 | 169.26 (වෙනත් දෙපාර්තමේන්තු වෙත පවරන ලද ප්‍රතිපාදන ද ඇතුළත්ව) |
| 02 | හිමිකම් විමර්ශන පැවැත්වීම | 120,000 | 102,861 | |
| 03 | හිමිකම් අයදුම්පත් කැඳවීම | 100,000 | 59,283 | |
| 04 | ඉඩම් රෙජිස්ට්‍රාර් පරීක්ෂා කිරීම් | 80,000 | 39,665 | |
| 05 | 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | 150,000 | 62,463 | |
| 06 | 14 වගන්තිය යටතේ ගැසට් කිරීම | 80,000 | 48,345 | |
| 07 | හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම | 80,000 | 43,542 | |

### 5.1.1 2024.01.01 සිට 2024.12.31 දිනට ඉඩම් නිරවුල් කිරීමට අදාළ භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය

**(1931 අංක 20 දරණ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත)**

**වගුව: 26.**

| අනු අංකය | නිරවුල් කිරීමේ පියවර | 2024 ඉලක්කය (ගම් සංඛ්‍යාව) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | උරුම විභාග පැවැත්වීම | 12 | 12 | 1,617 (මෙම අගයන් භාණ්ඩාගාර මුද්‍රිත පරිගණක පිටපත් අනුව වෙනස් විය හැක.) |
| 02 | මැන වෙන් කිරීම පරීක්ෂා කිරීම හා නිරවුල් කිරීමේ ආඥාව සඳහා විධානය සකස් කිරීම | 08 | 06 | |
| 03 | රේඛා චිත්‍ර ඉල්ලීම | 03 | 02 | |
| 04 | නිරවුල් කිරීමේ ආඥාව ලියාපදිංචි කිරීම | 08 | 01 | |
| 05 | නිරවුල් කිරීමේ ආඥාව අමාත්‍යාංශ අනුමැතියට යැවීම | 08 | 03 | |
| 06 | නිරවුල් කිරීමේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම | 07 | 00 | |
| 07 | නිරවුල් කිරීමේ අවසන් වාර්තාව ලියා ගම් නිදහස් කිරීම | 07 | 01 | |
| 08 | නිරවුල් කිරීමේ ආඥාව ඇතුලත් ගැසට් පත්‍රය හා පිඹුරු පත්‍රය උරුමකරුවන්ට බෙදා දීම | 03 | 01 | |

### 5.1.2. 2024.01.01 සිට 2024.12.31 දිනට ධාරිතා වර්ධනයට අදාළ භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය

වගුව: 27.

| අනු අංකය | විස්තරය | 2024 ඉලක්කය (පුහුණු සැසි) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | නිළධාරින්ගේ සේවා ව්‍යවස්ථාව අනුව වෘත්තියට අදාලව සම්පූර්ණ කළයුතු පුහුණු පාඨමාලා හා හිමිකම් තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටියට අදාළ ධාරිතා සංවර්ධන වැඩසටහන් | 25 නිළධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව අනුව වෘත්තියට අදාළව සම්පූර්ණ කළයුතු පුහුණු පාඨමාලා හා හිමිකම් තහවුරු කිරීමේ ක්‍රියාවලියට අදාළ ධාරිතා සංවර්ධන වැඩසටහන් | 100% | 1,482 |

## 5.2. 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

### 5.2.1 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

වගුව: 28.

| අනු අංකය | විස්තරය | 2025 ඉලක්කය |
|---|---|---|
| 01 | 12 වගන්තිය යටතේ ගැසට් කිරීම | 170,000 |
| 02 | හිමිකම් විමර්ශන පැවැත්වීම | 140,000 |
| 03 | හිමිකම් අයදුම්පත් කැඳවීම | 170,000 |
| 04 | ඉඩම් රෙජිස්ට්‍රාර් පරීක්ෂා කිරීම් | 105,000 |
| 05 | 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | 104,000 |
| 06 | 14 වගන්තිය යටතේ ගැසට් කිරීම | 104,000 |
| 07 | හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම | 104,000 |

### 5.2.2 1931 අංක 20 දරණ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත

නිරවුල් කිරීම සඳහා තෝරා ගත් ගම් 9661 කින් 08 ක් නිරවුල් කර අවසන් කිරීම.

වගුව: 29.

| අනු අංකය | නිරවුල් කිරීමේ පියවර | 2025 ඉලක්කය (ගම් සංඛ්‍යාව) |
|---|---|---|
| 01 | උරුම විභාග පැවැත්වීම | 35 |
| 02 | මැන වෙන් කිරීම පරීක්ෂා කිරීම හා නිරවුල් කිරීමේ ආඥාව සඳහා විධානය සකස් කිරීම | 08 |
| 03 | රේඛා චිත්‍ර ඉල්ලීම | 03 |
| 04 | නිරවුල් කිරීමේ ආඥාව ලියාපදිංචි කිරීම | 06 |
| 05 | නිරවුල් කිරීමේ ආඥාව අමාත්‍යාංශ අනුමැතියට යැවීම | 06 |
| 06 | නිරවුල් කිරීමේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම | 07 |
| 07 | නිරවුල් කිරීමේ අවසන් වාර්තාව ලියා ගම් නිදහස් කිරීම | 08 |
| 08 | නිරවුල් කිරීමේ ආඥාව ඇතුලත් ගැසට් පත්‍රය හා පිඹුරු පත්‍රය උරුමකරුවන්ට බෙදා දීම | 05 |

**5.2.3.** ධාරිතා වර්ධනය **වගුව: 30.**

| **අනු අංකය** | **විස්තරය** | **2025 ඉලක්කය (පුහුණු සැසි)** |
|---|---|---|
| 01 | නිළධාරින්ගේ සේවා ව්‍යවස්ථාව අනුව වෘත්තියට අදාලව සම්පූර්ණ කළයුතු පුහුණු පාඨමාලා හා හිමිකම් තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටියට අදාළ ධාරිතා සංවර්ධන වැඩසටහන් | නිළධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව අනුව වෘත්තියට අදාලව සම්පූර්ණ කළයුතු පුහුණු පාඨමාලා හා හිමිකම් තහවුරු කිරීමේ ධාරිතා සංවර්ධන වැඩසටහන් |

**5.2.4. ප්‍රමිතිගත සේවාවක් සැලසීම සඳහා සිදුකරනු ලබන වැඩසටහන්**

- ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යය පටිපාටිය
- මහජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය වැඩසටහන් හා ප්‍රචාරණ වැඩසටහන්
- 1998 අංක 21 දරන ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට කාලීන සංශෝධන එකතු කිරීම හා අනුමත කරවා ගැනීම.
- ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම හා මහජනතාවට තොරතුරු ලබාදීම සඳහා ඩිජිටල් පද්ධතිය වැඩි දියුණු කිරීම.

# 6. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

2010 අංක 1654/21දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට පහත අරමුණු යටතේ විෂය කටයුතු සංවිධානය කරගැනීමේ වගකීම පැවරී ඇත.

- ශ්‍රී ලංකාව සඳහා සම්මත කර ගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම.
- ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම.
- සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත්, පාරිසරික සමතුලිතතාවය රැකෙන පරිදිත් භාවිතා කිරීමට හැකි වනසේ උචිත තාක්ෂණික මග පෙන්වීම සිදු කිරීම.
- භූමිය පදනම් කරගත් සංවර්ධන සැලසුම්වල දී එම සම්පතේ ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම.
- විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැණුම පුහුණුව හා අධ්‍යයනය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## කාර්යයන්

- ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස්කිරීම සහ කාලීන අවශ්‍යතාවයන්ට අනුව එය සංශෝධනය කිරීම.
- විවිධ මට්ටම්වලින් ඉඩම් පරිහරණ නිර්දේශ ඇතුලත් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සහ එම නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා පාර්ශවකාර ආයතන හඳුනාගනිමින් අදාළ සම්බන්ධීකරණයන් සිදුකිරීම.
- ඉඩම් පරිහරණය විධිමත් කිරීමට තීරණ ගැනීමේ පහසුව සඳහා තාක්ෂණික නිර්දේශ ලබා දීම.
- විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සහ ආයෝජන අවස්ථාවන් වෙනුවෙන් විවිධ ආයතනවල ඉල්ලීම්වලට අනුව භූමි යෝග්‍යතා වාර්තා ලබා දීම.
- යාවත්කාලීන ඉඩම් පරිහරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙනයාම.
- භාවිතයට ගත හැකි, එහෙත් භාවිතයට නොගන්නා සහ ඌණ භාවිත ඉඩම්වල ගැටළු හඳුනාගෙන එම ඉඩම් ප්‍රශස්ත ඵලදායිතාවක් සහිතව භාවිතයට ගැනීම සඳහා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් සම්පත මගින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම උදෙසා සැලසුම්කරණයේදී අවශ්‍ය දත්ත සම්පාදනයට ඉවහල් වන විවිධ මට්ටමේ සමීක්ෂණ පැවැත්වීම (උදා.-ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය/ ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ සමීක්ෂණය, ජල මූලාශ්‍ර හඳුනා ගැනීමේ සමීක්ෂණය)
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු සම්බන්ධීකරණය.
- විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳව පාසැල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රජාවේ විවිධ කණ්ඩායම් දැනුවත් කිරීම.

## 6.1. 2024/ 12/ 31 දිනට ක්‍රියාත්මක සැලැස්ම අනුව ප්‍රගතිය

වගුව: 31.

| අනු අංකය | වැඩසටහන/ ව්‍යාපෘතිය | වාර්ෂික ඉලක්කය | භෞතික ප්‍රගතිය | % * | වාර්ෂික ඉලක්කය (රු.මිලියන) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | % * |
|---|---|---|---|---|---|---|---|
| 1. | ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම, දත්ත භූවමාරුව සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය | | | | | | |
| 1.1 | 1.1 ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය | අවසන් කරන ලද සමීක්ෂණයේ දත්ත ප්‍රකාශයට පත් කිරීම | 100% | 100 | 1.796101 | 1.710763 | 95 |
| 1.2 | 1.2 භූමි පරිහරණ වෙනස්කම් හඳුනා ගැනීමේ සමීක්ෂණය | දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි සමීක්ෂණ අවසන් කිරීම | 100% | 100 | 5.873899 | 5.717785 1 | 97 |
| 1.3 | 1.3 පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි ඉඩම් පරිහරණ ගැටලු හඳුනා ගැනීම, සිතියම්ගත කිරීම | යාපනය දිස්ත්‍රික්කයේ සමීක්ෂණ අවසන් කිරීම | 100% | 100 | 0.15 | 0.15 | 100 |
| 2. | පස සහ ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායීතාවය ඉහල නැංවීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘති 90ක් අවසන් කිරීම | 100% | 100 | 18 | 17.98808 2 | 100 |
| 3. | ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම | සැලසුම් 215 සකස් කිරීම | 100% | 100 | 11.18 | 11.07442 | 99 |
| 4. | ඉඩම් පරිහරණ සැලසුම්කරණ මාර්ගෝපදේශ සංවර්ධනය, උපාය මාර්ග සැකසීම සහ ඉඩම් පරිහරණ ප්‍රචාරණ කටයුතු | 2024 ක්‍රියාකාරී සැලැස්මෙහි මාර්ගෝපදේශ සැකසීම සහ දි.ඉ.ප. සැලසුම් සැකසීමට අදාල මාර්ගෝපදේශය සංවර්ධනය කිරීම. | 100% | 100 | 0.5 | 0.496326 | 99 |
| 5. | සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදු කරනු ලබන විශේෂ අධ්‍යයන | අධ්‍යයන 26ක් අවසන් කිරීම | 100% | 100 | 2.5 | 2.494648 | 100 |
| 6. | විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන්1019 ක් අවසන් කිරීම | වැඩසටහන්-1054 | 100 | 1.074 | 1.048731 | 98 |
| 7. | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම | කමිටු 69 අවසන් කිරීම | කමිටු -69 | 100 | 0.345 | 0.34173 | 99 |
| 8. | ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම | කමිටු 364 අවසන් කිරීම | කමිටු-413 | 100 | 1.124 | 1.118816 | 100 |
| 9. | දිස්ත්‍රික් කාර්යාලවල මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | රැස්වීම් 300ක් අවසන් කිරීම | රැස්වීම් -294 | 98 | 0.936 | 0.911926 | 97 |
| 10. | ප්‍රධාන කාර්යාලයේ කාර්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | රැස්වීම් 4 අවසන් කිරීම | 4 | 100 | 0.521 | 0.39697 | 76 |

## 6.2. 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

- ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම, දත්ත භූවමාරුව සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය
  - ➢ කෘෂිකාර්මික භූමි පරිහරණය සහිත ඉඩම් සඳහා කෘෂි වගා කළමනාකරණ පද්ධති වර්ගීකරණයක් (Farming System Classification) සැකසීම සහ වර්ගීකරණ සිතියම් සැකසීම පිළිබඳ නියමු ව්‍යාපෘති තුනක් (03) සිදු කිරීම
  - ➢ භූමි පරිහරණය/ ආවරණය වර්ගීකරණ සූචකය - ශ්‍රී ලංකාව සඳහා වන රෙජිස්ට්‍රිය/ඉන්වෙන්ට්‍රිය/ලේඛණය සැකසීම
  - ➢ 2026 – 2030 දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් (Five Year Strategic Plan) සැකසීම
- දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම
- තෝරාගත් උප ජලාධාර (Sub River Basin) සඳහා භූමි පරිහරණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම
- ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම
- පස හා ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකර්මික බිම්වල ඵලදායිතාවය ඉහල නැංවීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම
- ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම
- දිස්ත්‍රික් කාර්යාලවල මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- ප්‍රධාන කාර්යාලයේ කාර්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

# 07. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## හැඳින්වීම

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් ස්ථාපිත කරනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ශ්‍රී ලංකාව තුළ පුද්ගලයෙකුට තබාගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම, සුරක්ෂිත කිරීම සහ එම ඉඩම් ඵලදායී අන්දමින් සංවර්ධන ක්‍රියාවලියට යොමු කිරීම සිදුකරනු ලබයි.

## කාර්යයන්

01. ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධි විධානයන්ට අනුව පුද්ගලයෙකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම.
02. උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිෂන් සභාව සතු කර ගැනීම.
03. පනත්වලින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නීතිමය බැඳීම් නිදහස් කිරීම.
04. කොමිෂන් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.
05. පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.
06. ඉඩම් ලේඛණය යාවත්කාලීන කරමින් ක්ෂේත්‍ර හා සම්බන්ධ වී ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශි කිරීම.
07. රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.
08. රටේ සමාජ සංවර්ධනයට ඉඩම් දායකත්වය ලබාදීම.
09. ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
10. ආයතනික සංවිධානය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම.
11. පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම.
12. ආයතනික ඵලදායීතාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් හා පහසුකම් සලසාදීම.

## 7.1. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය

වගුව: 32.

| අනු අංකය | ආදායම හා වියදම | 12/31 දිනට ඉලක්කය (රු.) | 12/31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | % |
| | ආදායම් | | | |
| 01. | බදු ආදායම් | 240,000,000.00 | 95,927,586.94 | 39% |
| 02. | විකුණුම් ආදායම් | 145,275,884.63 | 145,275,884.63 | 100% |
| 03. | ඉඩම් අත්පත් | 300,000,000.00 | 428,794,692.32 | 143% |
| 04. | වෙනත් | 353,100,000.00 | 340,783,066.49 | 97% |
| | එකතුව | **1,038,375,884.63** | **1,010,781,230.38** | 97% |
| | වියදම් | | | |
| 01. | පුනරාවර්ථන වියදම් | 704,345,000.00 | 606,115,931.39 | 86% |
| 02. | ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | 340,984,600.00 | 265,073,249.20 | 78% |
| | එකතුව | **1,045,329,600.00** | **871,189,180.59** | **83%** |

## 7.1.2. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා භෞතික ප්‍රගතිය

වගුව: 33.

| අනු අංකය | වැඩසටහන/ ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | සැමට හිමි බිමක් ව්‍යාපෘතිය යටතේ ඔප්පු ලබාදීම. | ඔප්පු 4498 |
| 02 | පූජාභූමි ඔප්පු | ඔප්පු 07 |
| 03 | රජයේ ආයතන වලට පැවරීම් | අක්කර 172 |

## 7.2 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

- සකස් කරන ලද ඉඩම් ලේඛණයට අනුව, ස්ථානීයව හඳුනා ගත් ඉඩම් වලින්, භූමියේ නිදහස්ව පවතින ඉඩම් සිතියම්ගත කර ඊට අදාළ තොරතුරු පද්ධතිගත කිරීම.
- ඉඩම් ලේඛනය සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇති බැවින්, එක් එක් දිස්ත්‍රික් මට්ටමින් එම ඉඩම් නිසි පරිදි මැනුම් කිරීම සහ පිඹුරුපත් සකස් කිරීම.
- එම ඉඩම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තක්සේරු වාර්තාව ලබාගැනීම සහ නිසි පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම මඟින් විධිමත් ගිණුම්කරණ ක්‍රමවේදයන් පවත්වාගෙනයාම.

- ජාතික ආර්ථිකයට දායකවිය හැකි වන පරිද්දෙන් නිසි ශක්‍යතා අධ්‍යනය මඟින් ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩම් සහ ආයෝජකයින් තෝරා ගනිමින්, නිසි පරිදි ව්‍යාපෘති සඳහා ඉඩම් බෙහෙර කිරීමේ ක්‍රියාවලියක් පවත්වාගෙනයාම.
- ඉඩම් ගැටළු විසඳීම සඳහා අවශ්‍යතාවයන් පරිදි ජංගම සේවා පැවැත්වීම.
- දිස්ත්‍රික් මට්ටමින් දීප ව්‍යාප්ත ඔප්පු ලබාදීම.
- කොමිෂන් සභාව සතු ඉඩම් අතරින් ඌණ උපයෝජිත ඉඩම් හඳුනා ගැනීම සහ ඒවා විධිමත් පරිදි කළමනාකරණය කිරීම.
- රජයේ අවශ්‍යතා හඳුනා ගනිමින් සහ මහජන සුභසිද්ධිය උදෙසා රාජ්‍ය ආයතන සඳහා ඉඩම් බෙහෙර කිරීම.
- රට තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- "ශාසනාභිවන්දනා" වැඩසටහන මඟින් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සහ මුස්ලිම් සිද්ධස්ථාන සඳහා ඔප්පු ලබාදීම ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් ආගමික සංහිදියාව ඇති කිරීමට දායක වීම.
- 1931 විශේෂ දුරකථන අංකය මඟින් ඉඩම් ගැටළු හඳුනාගැනීම සහ ඒ සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.
- කොමිෂන් සභාව වෙත ඉඩම් ප්‍රකාශ කරන ලද ප්‍රකාශකයින් හට නීතිමය බැඳීම් කඩිනමින් නිදහස් කිරීම මඟින් ඔවුන්ගේ අයිතිය තහවුරු කිරීම සහ ප්‍රකාශකයින් හට වන්දි ගෙවීම කඩිනම් කිරීම.
- පුහුණු සහ අභිප්‍රේරණ වැඩසටහන් මඟින් කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවකයින්ගේ ධාරිතාව ඉහළ නැංවීමේ කටයුතු සිදුකිරීම සහ එමඟින් කාර්යක්ෂම මානව සම්පතක් ඇති කිරීමට කටයුතු කිරීම.
- නව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් රටේ සංවර්ධන කටයුතු වෙනුවෙන් නිවැරදි ලෙස කළමනාකරණය කර ගනිමින් ප්‍රශස්ත ලෙස දායක වීම සිදු කිරීම.